# යාපනයේ අසිරිමත් බෞද්ධ පුදබිම-කදුරුගොඩ

යාපනය නගරයේ සිට කි.මී. 10 පමණ උතුරු දිශාවට වන්නට පිහිටි කන්තරෝඩෙයි නමින් හදුන්වන ප්‍රදේශයේ සුවිශේෂී බෞද්ධ විහාරාරාම සංකීර්ණයක් දැක ගත හැක. යාපනය-කන්කසන්තුරේ මාර්ගයේ චුන්නාකම් සිට කි.මී. 2 ක් දුරින් පිහිටි ස්ථානයකින් හැරී යන මාර්ගයක ගමන් කිරීමෙන් හෝ පලාලි - කන්කසන්තුරේ මාර්ගයේ මාවඩ්ඩිපුරම් කෝවිල අසලින් හැරී යන මාර්ගයේ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ලඟා විය හැක. අද වන විට පුද බිම සමීපයට ම ගම්මානය ව්‍යාප්ත ව ඇති නිසා ආසන්නයට යන තෙක් ම මෙවැනි ස්ථානයක් එහි ඇතැයි සිතා ගැනීම පවා අපහසු ය.

කන්තරෝඩෙයි පෙර කල හැදින්වූයේ කදුරුගොඩ ලෙස ය. ඇතැමුන්ට අනුව එය කටුරොද හෝ කඳවුරුබැදිගොඩ විය යුතු ය. 15 වන සියවසේ ලියැවුණු නම් පොතේ ද යාපනයේ කදුරුගොඩ විහාරය ගැන සදහන් වේ. දියකදුරක් ගලා ගිය ස්ථානයක් අසබඩ උස් බිමක පිහිටි නිසා කදුරුගොඩ යන නම ලැබුණු බව කියැ වේ.

එකිනෙකට ආසන්නයේ පිහිටා ඇති කුඩා ස්තූප 20 ක් පමණත් තවත් ස්තූප 30ක පමණ නටඹුණුත් කදුරුගොඩ දී දැකගත හැක. මේ ආකාරයේ එක් තැනක කුඩා ස්තූප රැසක් පිහිටා ඇති වෙනත් ස්ථානයක් ලංකාවේ දී හමු නො වේ. එකම හැඩයකට නිර්මාණය කර ඇති මේ ස්තූප විවිධ ප්‍රමාණයේ ය. දැනට සුරැකි ව ඇති විශාලම ස්තූපය මීටර් 7 ක පමණ විෂ්කම්භයකින් ද කුඩාම ස්තූපය මීටර් 2 ක පමණ විෂ්කම්භයකින් ද යුතු ය. පේසා වළලු කිහිපයක් මතල හුණු ගල් විශේෂයකින් මේ ස්තූප ඉදිකර ඇත. ඇතැම් ස්තූප වල පමණක් කොත්කැරැල්ලක් දැක ගත හැක.





කදුරුගොඩ විහාරය

කදුරුගොඩ විහාරය ගැන මෑත ඉතිහාසයේ අවධානය යොමුකළ පුද්ගලයන් අතර යාපනය දිස්ත්‍රික් විනිසුරු පදවිය දැරූ පෝල් ඊ පීරිස් මහතා කැපී පෙනේ. ඒ මහතා 1917 වසරේ දී එම ස්ථානයට ගොස් එහි තත්ත්වය සොයා බලා, ඒ ගැන ලිපියක් එම වර්ෂයේ රාජකීය ආසියාතික සමිති සඟරාවට සැපයී ය. පසු ව එම තොරතුරු අනුව 1965 වර්ෂයේ දී එහි ගිය එවකට පුරාවිද්‍යා කොමසාරිස් ධූරය දැරූ සී.ඊ.ගොඩකුඹුර මහතා, මහත් කැපකිරීමක් කොට ස්තූප සමූහය අද දක්නට ලැබෙන තත්ත්වයට පිළිසකර කෙරවී ය. කදුරුගොඩ සිදු කළ කැණීම් වලින් පුරාවිද්‍යාත්මක වැදගත් කමෙන් යුත් පුරා වස්තු රැසක් හමු වී ඇත. බුදුපිළිම කිහිපයක කොටස්, සිරිපතුල් ගලක්, සෙල් ලිපි සහිත අත්තාණි කණු, සඳකඩපහණනක කොටස්, වාමන රූප , මුරගල්, ගල් ගරාදි වැටක කොටස්, උළු කැට, පබළු, වළං ,පාත්‍රා කැබලි සහ විවිධ වර්ගයේ කාසි ඒ අතර වේ.

කදුරුගොඩ විහාරයෙන් ලැබුණු පුරාවස්තු, සෙල් ලිපිවලින් හෙලි වන තොරතුරු අනුවත් වෙනත් ඓතිහාසික ලේඛණ අනුවත් අවම වශයෙන් ක්‍රි.ව පළමු සියවසේ සිට මෙම ස්ථානය බෞද්ධ සිද්ධස්ථානයක් ලෙස පැවත ඇත. විවිධ අවස්ථාවල දී සිංහල රජවරුන් කදුරුගොඩ විහාරය උදෙසා සිදුකල පුදසත්කාර පිළිබඳ විස්තර රැසකිග බුදුරජාණන් වහන්සේගේ දෙවන ලංකා ගමනේ දී නාගදීපයට යනුවෙන් වැඩම කළේ මෙම ස්ථානයට බවට වන  අදහසක් ද ඇතග

පණ්ඩුකාභය රජ සමයේ සිට ක්‍රි.ව 16 වන සියවසේ සංකිලිගේ පාලනය දක්වා යාපනය ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවන්ගෙන් බහුතරය සිංහලයෝ වූහ. ඒ හැරුණු විට වෙළඳ ගණු දෙනු සඳහා පැමිණි විවිධ ජාති, ජනවර්ගවලට අයත් පුද්ගලයෝ ද එහි වූ හ. යාපන විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ ආචාර්යයවරයකු වූ කාර්තිගේසු ඉන්ද්‍රපාල මහතා පෙන්වා දී ඇති පරිදි ක්‍රි.ව 13 වන සියවස දක්වා යාපනය ප්‍රදේශයේ අඛණ්ඩ ව පැවත එන ස්ථිර දෙමළ ජනාවාස තිබී නැත. යුධ කටයුතු හා වෙනත් විවිධ කටයුතු සඳහා අනුරාධපුරයට පැමිණ ස්ථිර ලෙස පදිංචි වූවන් පරම්පරා කිහිපයකින් සිංහල බවට පත්වීමත්ල ඉතිරි පිරිස් යාපනයේ සිට එතරම් දුරින් නො පිහිටි තම මුල් ගම් බිම් කරා නැවත පිටත් ව  යෑමත් නිසා යාපනය ප්‍රදේශයේ දෙමළ හෝ වෙනත් දකුණු ඉන්දීය ජනවාර්ගිකයන්ගේ ස්ථිර වාසස්ථාන නො පිහිටන්නට ඇත.

කදුරුගොඩ විහාරයෙන් හමු වූ සිව්වන කාශ්‍යප හෝ සිව්වන දප්පුල රජ සමයට අයත් අත්තාණි කණුවක වූ සෙල් ලිපියක දක්වා ඇති පරිදි අභයගිරි විහාරය සමග මේ ස්ථානයේ යම් සබඳකමක් තිබී ඇත. අත්තාණි කණු සෙල් ලිපියේ ප්‍රධාන අක්ෂර අතර වූ, පසුව ලියන ලදැයි කියැවෙන කුඩා අක්ෂරවලින් පැවැසෙන පරිදි මේ ස්තූප සංකීර්ණය අග්නිදිග ආසියාතික ශෛලේන්ද්‍ර පරපුරට අයත් ඇමතිවරයකු කරවූවක් විය හැකි බව සෙනරත් පරණවිතාන මහාචාර්යයතුමා පවසා ඇත.

මධ්‍යම ජාවා හි පිහිටි බොරෝබුදූර් විහාර සංකීර්ණයේ හා කදුරුගොඩ විහාරයේ යම් සමානකමක් ඇත. එම ස්ථාන දෙකේම කුඩා වපසරියක් තුළ ස්තූප රැසක් දැක ගත හැක. බොරෝබුදූර් හි එක් විශාල ස්තූපයක් වටා කුඩා ස්තූප රාශියක් යම් රටාවකට අනුව නිර්මාණය කර ඇත. ක්‍රි.ව 9 වන සියවසේ දී ඉදි කළා යැ යි සැලකෙන බොරෝබුදූර් අද වන විට ලෝකයේ ඉතිරිව ඇති විශාලත ම බෞද්ධ සිද්ධස්ථානය ලෙස සැලකේ. බොරෝබුදූර් විහාර සංකීර්ණයේ සැලසුම සකස් කළේ අභයගිරිවාසී **ගුණධර්ම** නම් භික්ෂුන් වහන්සේ නමක බව ඒ ගැන කරුණු සොයා බැලූ මහාචාර්යය සීසර් වූට් පවසයි.





## බොරෝබුදූර් විහාරය

දඹදෙණි දෙවන පරාක්‍රමබාහු රජ සමයේ චන්ද්‍රභානු නම් ජාවකයකු ලංකාව ආක්‍රමණයට උත්සාහ දැරූ බව ඓතිහාසික ලේඛනවල සඳහන් ය. පළමුව ක්‍රි.ව 1247 දීත් දෙවනුව ක්‍රි.ව 1262 දීත් ලෙස දෙවරක් ඔහු සිංහල රාජධානියට පහර දීමට තැත් කර ඇත. පළමු වර පැරද පළා ගිය චන්ද්‍රභානු දෙවන වර වඩා සංවිධානාත්මක ව පැමිණ ඇත. එවර ඔහු භක්තිමත් බෞද්ධයකු ලෙස පෙනී සිටිමින් රටේ උතුරු ප්‍රදේශයේ යම් බලයක් ගොඩනගා ගැනීමට සමත් විය. චන්ද්‍රභානුල තුන් සිංහලයේ රජකමත්, දන්ත ධාතූන් වහන්සේත්, පාත්‍ර ධාතුවත්, ඉල්ලා සිටි බව මහාවංශයේ දැක් වේ. මලයා අර්ධද්වීපයේ තාම්බ්‍රලිංග ප්‍රදේශයේ (වත්මන් දකුණු තායිලන්තයට අයත් ප්‍රදේශයකි) සිට පැමිණි අයකු ලෙස සැලකෙන චන්ද්‍රභානු ද බොරෝබුදූර් විහාර සම්ප්‍රදාය ගැන දැන සිටින්නට ඇත. ඇතැම් විට කඳුරුගොඩ ස්තූප සංකීර්ණය චන්ද්‍රභානුගේ අනුදැනුම මත ඉදිවූවක් විය හැක. යාපන සිංහල බෞද්ධයන්ගේ අතිමහත් ගෞරවයට ලක්වෙමින් පැවති කඳුරුගොඩ එවැනි ඉදිකිරීමක් සිදුකර චන්ද්‍රභානු බලාපොරොත්තුවන්නට ඇත්තේ යාපනයේ සිංහල බෞද්ධයන්ගේ සිත් දිනා ගැනීම යි.

අද ලංකාවේ වෙනත් කිසිදු ස්ථානයක දක්නට නො ලැබෙන ආකාරයේ ස්තූප සමූහයක් දැකගත හැකි, බුද්ධ පාද ස්පර්ශයෙන් පූජනීය බවට පත් වූයේ යැයි සැලකෙන කඳුරුගොඩ විහාරය වසර දෙදහසකටත් වඩා වැඩි කලක් සිංහල බෞද්ධයාගේ වැඳුම් පිදුම් වලට ලක් වූ පුද බිමකි. එය, පින් කැමැත්තෝ පැමිණල දැකල සිත් පහදවාගෙන වැඳ පුදා ගත යුතු මහගු පින් බිමකි. ඒ සමගම මේ ස්ථානය රැක බලා ගෙන පුද සත්කාර කරන ශ්‍රී ලංකා යුධ හමුදාවේ රණ විරුවන්ට ද අපගේ ශීර්ෂ ප්‍රණාමය හිමි විය යුතු ය.

යාපනයේ සංචාරයකින් පසු

**වෛද්‍ය චන්න සුදත් ජයසුමන**